## “ කප් එක දිනුවෙ නැති එක වෙනම දෙයක්...... ඒත් ඔබ අපට කෝටියක් වටිනවා......” ජනතාව කියති



# ඉන්දියාවේ සහ අපේ වෙනස

**මෙ**වර ක්‍රිකට් ලෝක ශූරතා තරඟාවලියේදී අපි ක්‍රිකට් ගැනද, එම ක්‍රීඩාව අප ද අනෙක් කණ්ඩායම් සෙල්ලම් කළ ආකාරය ගැනද, ඒ තරඟ වලට සහභාගී වූ විවිධ ජාතීන් ගැනද බොහෝ දේ ඉගෙන ගත්තෙමු. ඒ සියල්ලටම වඩා ඉන්දියාව හා ලංකාව අතර ජාතික වශයෙන්, සිතුම් පැතුම් වශයෙන්ද විශාල වෙනසක් ඇති බව සාක්ෂාත් කරගත්තෙමු.

අප අවසාන තරඟයෙන් පරාජය වූ අතර ඉන්දියාව ඉන් දිනුවාය. ඔවුන් අපට වඩා හොඳින් ක්‍රීඩා කළ නිසා එසේ වූ බව හැර වෙන කුමක් කියන්නද? සත්‍යයද එයම ය.

ඉන්දියාව ඒ තරඟයේදී පරාජය වූවානම් ඒ රටේ විශාල කළබල, ලේ වැගිරීම්, කඩසාප්පු හා ගෙවල් ගිනිතැබීම්, පමණක් නොව ඒ පිළේ ක්‍රීඩකයින්ට ශාරීරික හානිද, ඒ අයගේ දේපළ වලට විශාල හානි ද සිදුවෙනවා නොඅනුමානය. එසේම ඉන්දියාව අවසන් තරඟයට සුදුසුකම් ලබන්නට ක්‍රීඩාකළ තරඟ යේදී එදා ඉන්දියාව පකිස්ථානයට පැරදුණේ නම් විශාල ජීවිත හානිද, ලේ වැගිරීම්ද, හින්දු මුස්ලිම් කෝලාහලයක්ද ආරම්භ වෙනවා නියතය. ඉන්දියා කප්එක දිනූ නිසා ඒ සියල්ල බේරුණු බව පෙනේ.

ඉන්දියාවේ හින්දු පත්‍රයේ පළවූ ලිපියක් මම කියවූයෙමි. ඒ ලිපිකරු ශ්‍රීලංකාව ගැන ඉමහත් සොම්නසින්ද පැහැදීමෙන්ද යුතුව ලියා, ඉහළ ඇති සංගක්කාර හා මුරලි සෙනග අතර සිටින පින්තූරයද ඒ සමග පළකර, අපේ රටේ ජනතාවගේ මහාත්මා ගුණය ගැන වර්ණනා කර තිබුණි. එසේම ඊට කලින් වාර කීපයකදීම ඉන්දියාව පැරදුණු විට ඉන්දියාවේ ක්‍රිකට් පිස්සු අවිනීත ජනතාව තම ක්‍රීඩකයින්ට ගැරහූ හැටිද, පහර දෙන්නට ගිය හැටිද, ඔවුන්ගේ පින්තූර හා පෝස්ටර් ගිනිබත් කළ හැටිද විස්තර කර, ලංකාවේ ක්‍රිකට් ලෝලී ජනතාව ඉන්දියාවට ආදර්ශයක් බව වැඩිදුරටත් කියා තිබුණි.

ක්‍රිකට් කප් එක නොලැබුණු බව ඇත්ත. කමක් නෑ. ඒත් අපට කීර්තිය ගෙනා ඔබ හැමදාම අපට වටිනවා! ඒ හැඟීම ඇති!

♦ වෙනුර




ඉන්දියාව 2003 දී වර්ල්ඩ් කප් එක පැරදුණු විට ඉන්දීය පිළේ ක්‍රීඩකයින්ගේ පෝස්ටර් වල දැලි ගා විකෘතිකළ හැටිය මේ. තරුණයා කළු සායම් හට්ටියක් ළඟ තබාගෙන වැඩෙහි යෙදී සිටී.



## 1996 ශ්‍රීලංකාව ලෝක ශූරතාව දිනූ දා

**ලෝ**ක ක්‍රිකට් ශූරතාවේ අවසන් තරඟය පැවතුනේ පකිස්ථානයේ ගඩාෆී ක්‍රීඩාංගනයේ 1996 මාර්තු මස 17 වන දිනය. එය දිවා රාත්‍රි තරඟයක් විය. ශ්‍රීලංකා පිළ සමග අවසන් තරඟයට වැටුණේ මාක් ටේලර් නායකත්වය දැරූ ඕස්ට්‍රේලියා පිළයි. අර්ජුණ රණතුංග ලංකා පිළේ නායකයාය. ඔහු සමග සනත් ජයසූරිය, රොමේෂ් කළුවිතාරණ, අසංක ගුරුසිංහ, අරවින්ද ද සිල්වා, රොෂාන් මහානාම, හෂාන් තිලකරත්න, කුමාර ධර්මසේන, චමින්ද වාස්, ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ, මුත්තයියා මුරලිදරන් යන ක්‍රීඩකයෝ කණ්ඩායමේ වූහ. ලංකා පිළ කාසියේ වාසිය දිනුවත් මුලින් පන්දුවට පහරදීම අර්ජුණ ඕස්ට්‍රේලියාවට දුන්නේය. ඕස්ට්‍රේලියාව කඩුළු 7 ක් දැවී ලකුණු 241 ක් රැස් කර තිබුණි ශ්‍රීලංකා පිළ එහිදී පන්දු වාර 46.2 කදී කඩුළු තුනක් දැවී ලකුණු 245 ක් රැස්කරමින් තරඟය විශිෂ්ඨ ලෙස නිමවා ඉතිහාසයේ ප්‍රථම වරට ලෝක ශූරතාවක් දිනාගත්තේය.

පින්තූරයේ දැක්වෙන්නේ නායක අර්ජුණ රණතුංග ශූරතාව ලැබූ අවස්ථාවේ මහත් අභිමානයෙන් හා සිනාමුසු මුහුණින් යුතුව කැමරාකරුවන්ට, මාධ්‍යකරුවන්ට හා ටෙලිවිෂන් ලෝකයට මුහුණු දුන් ආකාරයයි. ඔහුගේ වම්පසින් සිටින්නේ අතීත ඕස්ට්‍රේලියානු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩක ග්‍රෙග් චැපල්ය. වම්පසින් අත්පොලසන් දෙන කාන්තාව මැතක නැසීගිය පකිස්ථානු අගමැතිනිය බෙනාසීර් භූතෝ මහත්මියයි.

## සයිප්‍රසයේ සිදුකළ පූජා සත්කාර සේවාවක්!

ශ්‍රී සම්බුද්ධජයන්ති සැමරුම නිමිති කොට මෙම වසර පුරා සයිප්‍රසයේ ලංකාරාම විහාරස්ථ බෞද්ධ සංගමය මගින් පවත්වනු ලබන විවිධ ආගමික වැඩසටහන් මාලාවේ ආමිෂ හා ප්‍රතිපත්ති පූජාවන් සිදුකෙරෙමින් පවතින අතර පූජා සත්කාර අසරණ සරණ ව්‍යාපෘතිය යටතේ අංග විකල පිරිසක් වෙනුවෙන් ක්‍රියාවට නැංවූ එක් වටිනා පින්කමක් ගැනයි මේ සටහන. දිනය 2011 අප්‍රියෙල් මස 3 වන ඉරුදිනයයි. ස්ථානය සයිප්‍රසයේ ලිමාසෝල් නගරයේ අයියොස් ස්තැපානොස් නම් වූ අංගවිකල පිරිසක් වෙසෙන මඩමකි.

ලංකාරාම විහාරස්ථ සැදැහැතියන් ඉතා දුක් මහන්සිව ඉපයූ මුදලින් යම් කොට- සකින් එක් රැස් කළ වියලි ආහාර, පළතුරු, චොකලට් හා බීම වර්ග එමෙන්ම දෛනික පරිහරණයට අවශ්‍ය සබන් තුවා දත්බෙහෙත් හා බුරුසු ආදී බොහෝ දෑ මෙම අංගවිකල පිරිස වෙනුවෙන් බෙදාදීමට සූදානම් කොට එම ස්ථානයටම ගොස් බෙදාදීම විහාරාධි පති පූජ්‍ය මොරවක සෝරත නායක ස්වාමීන් වහන්සේගේ දැතින්ද සැදැහැතියන්ගේ දැතින්ද සිදුවීය. මෙහිදී එම ස්ථානය බාර සයිප්‍රස් ජාතික නිලධාරීන් ඉමහත් පැහැදීමට පත්වුණා පමණක් නොව එහි මූලික අරමුණ අප සම්බුදු රජාණන් වහන්සේ දේශනා කළ අසරණ සරණ ගුණය හා ගිලාන උපස්ථාන ගුණය ගැන බොහෝ කතාබහට ලක්විය. බෞද්ධ දර්ශනය ගැන ඔවුන් තුළ පැහැදීමක් තිබෙන බවද සයිප්‍රසයට පැමිණ සේවය කරන අප ශ්‍රීලාංකිකයින්ගේ සමහරකගේ යම් යම් වැරදි අඩුපාඩු නොමිනිස්කම් ආදී දේ කෙතෙකුත් තිබුණද ශ්‍රීලාංකිකයින් බහුතරයක් ම ගුණ ධර්ම හා සුහදබව අතින් පිරිපුන් අය බවද ඔව්හු සඳහන් කළෝ ය.

විශේෂයෙන් මෙවන් යහපත් ක්‍රියා තුළින් පින් සිදුකරගන්නවා පමණක් නොව මෙවන් රටවල වාසය කරන යුරෝපීය අය අපේ ආගම දහම හා අපේ ගති සිරිත් හා සාරධර්ම පිළිබඳ පැහැදීමක් ඇතිකරගන්නා අතර එයින් අප මව්බිමේ නාමයටද කීර්තියක් ප්‍රශංසාවක් අත්වනු නොඅනුමාන ය.

සටහන - ♦ විමලා යාපා
Cyprus

